# බලන්ගොඩ නගර සභාව

**2013 වර්ෂය සඳහා බලන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැළ මස් කඩ, විවෘත කඩ අංක 06 සහ බලන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමට සුදුසු බදු කරුවන් තෝරා ගැනීම සඳහා ලංසු පත් කැඳවීම**

2013 ජනවාරි මස පළමු වන දින සිට 2013 දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා වූ ලිත් වර්ෂයක කාලයක් සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන අයිතමයන් වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසුපත් බලන්ගොඩ නගර සභාවේ සභාපති වන මා විසින් 2012 නොවැම්බර් 15 වන දින පෙ.ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

**ලංසුපත් නිකුත් කිරීම:**

2012 නොවැම්බර් 14 වන දින ප.ව. 3.00 දක්වා බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ වැඩි විස්තර කාර්යාලීය දුරකථන අංක 045-2287275 ඇමතීමෙන් හෝ urbanbg@ sltnet.lk වෙතින් ලබාගත හැකය.

**ලංසුපත් විවෘත කිරීම:**

2012 නොවැම්බර් මස 15 වන දින පෙ.ව.10.00 දක්වා ලංසුපත් භාරගනු ලබන අතර පෙ.ව. 10.30 ට විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකිය.

**විශේෂ කොන්දේසි (මස් කඩ සඳහා)**

මස් කඩ සඳහා ලංසුපත් ඉදිරිපත් කරනු ලබන ලංසුකරුවන් විසින් බලන්ගොඩ නගරසභා බල සීමාවේ ප්‍රමිතියට තැනූ වලංගු බලපත්‍රයක් සහිත අනුමත ගෝ ඝාතකාගාරයක් සපයා ගත හැකි බවට පිළිගත හැකි ලේඛන පිටපත් ලංසුපත් සමග අමුණා ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් මණ්ඩලය ඉල්ලා සිටිය හොත් එම ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

## උප ලේඛනය

| අනු අංකය | ලංසුපත් කැඳවනු ලබන වෙළඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසුපත් ගාස්තු | | | | අවම වාර්ෂික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | | ගාස්තුව | වැට් | ජා.ගො.බ | එකතුව | |
| 01 | පොදු වෙළඳ සැල අංක 15 දරණ එළු මස් කඩය | රු.3,000.00 | රු.1000.00 | රු.122.00 | රු.20.00 | රු.1142.00 | රු.83,107.00 |
| 02 | පොදු වෙළඳ සැල අංක 16 දරණ එළ හරක් මස් කඩය | රු.10000.00 | රු.1000.00 | රු.122.00 | රු.20.00 | රු.1142.00 | රු.1,650,554.00 |
| 03 | පොදු වෙළඳ සැල අංක 17 දරණ කුකුල් මස් කඩය | රු.5000.00 | රු.1000.00 | රු.122.00 | රු.20.00 | රු.1142.00 | රු.352,546.00 |
| 04 | විවෘත කඩ (කාර් පාක්) අංක 06 කඩ කාමරය | රු.3000.00 | රු.1000.00 | රු.122.00 | රු.20.00 | රු.1142.00 | රු.128,700.00 |
| 04 | බලන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම | රු.3000.00 | රු.1000.00 | රු.122.00 | රු.20.00 | රු.1142.00 | රු.879,780.00 |

අවම ලංසුවට අමතරව රජය විසින් කලින් කලට පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.

තෝරා ගන්නා ලද බදු කරුවන් විසින් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර එය වාරික දෙකක් වශයෙන් බලන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක කොටසක් ලංසු කරු තෝරා ගෙන පළමු පැය තුළ අනිවාර්යයෙන්ම ගෙවිය යුතුය. ඉතිරි කොටස් දෙක එක වර ගෙවා 2012.12.31 දින වන විට ඉදිරි වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කළ යුතුය.

සියළුම ටෙන්ඩර් හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයේ ඕනෑම කොටසක් හෝ පිළිගැනීමේ අයිතිය බලන්ගොඩ නගර සභාව සතුය.

2012 ඔක්තෝබර් 15 වන දින,
බලන්ගොඩ නගරසභාවේදීය.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව